PAFFREL
නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය.
சுதந்திரமானதும் நியாயமானதுமான தேர்தல்களுக்கான மக்கள் செயற்பாடு.
PEOPLE'S ACTION FOR FREE & FAIR ELECTIONS

මහින්ද දේශප්‍රිය මැතිතුමා,
සභාපති,
මැතිවරණ කොමිෂන් සභාව,
රාජගිරිය.
2020.06.14

**කොවඩ් - 19 වසංගත තත්වය තුළ මැතිවරණ පැවැත්වීම සම්බන්ධව නිකුත් කළ මාර්ගෝපදේශ නිරෝධායනය සහ රෝග වැළැක්වීමේ පනත යටතේ ගැසට් කිරීම.**

කොරෝනා වසංගත තත්වය හමුවේ පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු සෞඛ්‍යය මාර්ගෝපදේශ මේ වනවිටත් හඳුන්වා දී ඇති අතර ඒ අතුරින් ඇතැම් මාර්ගෝපදේශ ජනජීවිත සුරක්ෂිත කිරීමේ අරමුණින් ඉතා සාධනීය වුව ද සමහර නිර්දේශ මැතිවරණය අරභයා ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ හැකි ද යන්න සංවාදයක් දේශපාලන පක්ෂ ඇතුලු විවිධ පාර්ශවයන් මතු කරමින් සිටී.

ඒ අනුව හැකි ඉක්මණින් මැතිවරණ ක්‍රියාවලියට සෘජුවම සම්බන්ධ වන දේශපාලන පක්ෂ ඇතුලු අනෙකුත් පාර්ශවකරුවන් සමග විධිමත් සාකච්ඡාවක් කැඳවා එකගතාවයකට එළඹිය යුතු බවත් ඒ අනුව එකඟවන යෝජනා නිරෝධායනය සහ රෝග වැළැක්වීමේ පනත යටතේ ගැසට් කර නිසි නෛතික බලයක් ලැබෙන වැඩ පිළිවෙළක් නිර්මාණය කළ යුතු බවත් යෝජනා කරමු.

එමෙන් ම එවැනි එකගතාවයක් ඇතිකර ගැනීම හරහා මැතිවරණ ක්‍රියාවලියේ ප්‍රමුඛතම පාර්ශවයක් වන දේශපාලන පක්ෂ නියෝජිතයින් දැනුවත් වීම මගින් මෙකී නිර්දේශ පහසුවෙන් ක්‍රියාත්මක කිරීම සඳහා හැකියාවක් ලැබෙනු ඇතැයි අපි විස්වාස කරමු. එසේ නොවන තත්ත්වයක් තුළ කොතරම් යහපත් යෝජනා තිබුණ ද ඒවා ප්‍රායෝගිකව සහ ඵලදායක අයුරින් සමාජය තුළ ක්‍රියාත්මක කළ නොහැකි නම් ඉන් සිදුවනුයේ එකී මාර්ගෝපදේශ නොතකා හැරීම හේතුවෙන් මැතිවරණ ක්‍රියාවලිය තුළ අනවශ්‍ය ගැටළුකාරී තත්ත්වයක් නිර්මාණය වීමයි.

පවත්නා නව ප්‍රවණතාවය හමුවේ සෞඛ්‍ය නිර්දේශ පමණක් නොව ඉන් පරිබාහිරව ඇති මැතිවරණයන්ට අදාළව නෛතික ප්‍රතිපාදන සම්බන්ධයෙන් ද පැහැදිළි නිශ්චිත මග පෙන්වීමක් ලබාදීම හරහා නිදහස් හා සාධාරණ මැතිවරණයකට අදාළ වටපිටාව සකස් කිරීම මගින් ජනතා පරමාධිපත්‍ය බලය අභ්‍යාස කිරීමට ඡන්ද දායකයන්ට අවස්ථාවක් සැළසෙනු ඇතැයි අප විශ්වාස කරමු.

ස්තූතියි.

රෝහණ හෙට්ටිආරච්චි,

විධායක අධ්‍යක්ෂක,
පැෆ්රල් සංවිධානය.

# No.16, Byrde Place, Off Pamankada Rd, Colombo 06, Sri Lanka.
Tel: (+94) 11 2 558 570 / 11 2 558 571 Fax: (+94) 11 2 558 572
E-Mail: paffrel@sltnet.lk Website: www.paffrel.lk